ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,516 - 2026 නොවැම්බර් මස 20 සිකුරාදා - 2026.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	-	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	-

සැ.යු.: මහරගම තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2026.11.13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

සතිපතා නිකුත් වන *ගැසට් පත්‍රයෙහි* පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම් සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 දෙසැම්බර් මස 11 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 නොවැම්බර් මස 27 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82850 - (2026/11)
E - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම කැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යටෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම්, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යටෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම් ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්ට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අනිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19ත් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සක් කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලිසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පොදුගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීන්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වුවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බස කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය භාරගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය භාරගනුගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. භාරගනුගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිබිනව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සම්පයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සම්පයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහනික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බිලූටුත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පැන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රුලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සැදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳින රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවහ සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කරා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු - ඇබෑර්තු

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම - 2026

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පැවැත්වෙන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2027 ජනවාරි මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

අනු. අංකය	*තනතුරු නාමය*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*බඳවා ගන්නා ශ්‍රේණිය*
	ජල විද්‍යා මිනුම් සහායක	*26*	*III ශ්‍රේණිය*

1.2 තනතුරෙහි රාජකාරී ස්වභාවය

තනතුරු නාමය	*අනෙකුත් කාර්යයන්*	
ජල විද්‍යා මිනුම් සහායක	I.	තම සේවා මුරය තුළ සෑම පැයකට වරක් හෝ උපදෙස් දී ඇති පරිදි වෙනස් කාල පරාසයන් තුළ හෝ අදාළ ගංගාවල ජල මට්ටම් කියවා ලකුණු කිරීම.
	II.	ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාරවරුන් විසින් විසර්ජන මිනුම් සහ අනෙකුත් භූගෝලීය මිනුම් කරන අවස්ථාවල අවශය සියලුම සහය ඔවුන්ට ලබාදීම.
	III.	ජල මිනුම් ස්ථානවල සවිකර ඇති සහ එම ස්ථානයට නිකුත් කර ඇති සියලුම රජයේ උපකරණ සහ ද්‍රව්‍යවලට ආරක්ෂාව සැලසීම සහ ඒවා මනාව නඩත්තු කිරීම.
	IV.	ජල මිනුම් ස්ථානයට අයිති භූමිය, ගොඩනැගිලි, මිනුම් කණු මනාව නඩත්තු කර පිරිසිදුව තබා ගැනීම.
	V.	ජල මිනුම් ස්ථානයට අයිති වෙනත් කාලගුණික උපකරණ ඇත්නම් ඒවායේ මිනුම් කියවා වාර්තාගත කිරීම.
	VI.	ක්ෂේත්‍ර ගංගා ජල මිනුම් සහ වර්ෂාමාපක දත්තයන් ජල විද්‍යා අංශයෙන් පිළියෙළ කර සපයන ලද මුද්‍රිත පෝරමවල ලකුණු කිරීම.
	VII.	ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ගංගාවල දිග, පළල මට්ටම් ගැනීම වැනි මිනුම් කටයුතු කිරීමේ දී අවශ්‍ය සහය ලබා ගැනීම.
	VIII.	ගුවන් විදුලි පණිවිඩ හුවමාරු යන්ත්‍ර ක්‍රියා කරවීම.
	IX.	හදිසි තත්ත්වයක දී එනම් උපකරණ ක්‍රියා විරහිත වීමක දී හෝ තදබල වර්ෂාපතනයක දී හෝ ගංවතුර තත්ත්වයකදී ඒ බව ජල විද්‍යා අංශය වෙත දැනුම් දීම.
	X.	ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

02. බඳවා ගැනීමේ ක්‍රමය :

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ. එම සම්මුඛ පරීක්ෂණයේ දී ම පහත සඳහන් නිර්ණායක භාවිත කරමින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*
අධ්‍යාපන සුදුසුකම්	25
පළපුරුද්ද	40
අතිරේක වෘත්තීය සුදුසුකම්	10
විෂය බාහිර ක්‍රියාකාරකම්	20
සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව	05
එකතුව	100

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගත් අනුපිළිවෙළ මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

03. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි P 02 - 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු. 41,800-10x490-10x540-12x590- 12x630 රු. 65,560/- වේ.

එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිර වන අතර වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිත වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

III. අදාළ තනතුරේ III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ සම්පූර්ණ කළ යුතු ය.

V. රාජ්‍ය සේවයේ පත්වීම් පාලන කරන පොදු කොන්දේසිවලට ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන හා එයට වරින්වර කරනු ලබන සංශෝධනවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත් ව තෝරාගනු ලැබේ.

05. වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

06. අවශ්‍ය සුදුසුකම් :

i. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

6.2 වෘත්තීය සුදුසුකම් :

තනතුරු නාමය	*තනතුරට අදාළ ශිල්පීය නිපුණතා*
ජල විද්‍යා මිනුම් සහයක	රජයේ හෝ පෙද්ගලික අංශයේ පිළිගත් ඉංජිනේරු සමාගමක කාලගුණික උපකරණ කියමීව (වර්ෂාමාණ ආදිය) සම්බන්ධයෙන් හෝ මිනින්දෝරු කම්කරුවකු වශයෙන් අවම වශයෙන් අවුරුදු 03ක පළපුරුදු සහතිකයක් ලබා තිබීම.

6.3 පළපුරුද්ද : තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

6.4 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකු ම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

6.5 වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරුවන් 06 වන ඡේදයෙහි සඳහන් සියලු සුදුසුකම් **දෙදහස් විසිහය වර්ෂයේ (2026) නොවැම්බර් මස 30 දින හෝ ඊට පෙර** හෝ සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඇමිණිය යුතු ය.

7. අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21x29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතු ය. අංක 1 සිට 3 දක්වා පළමු පිටුවේ ද, අංක 4 සිට 5 දක්වා දෙවන පිටුවේ ද, අංක 6 සිට 8 දක්වා තුන්වන පිටුවේ ද, ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

II. අයදුම්පත් සකස් කළ යුත්තේ තමා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් පමණි.

III. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී එක් අයදුම්පතක් සඳහා අයදුම්පත් හා සම්මුඛ පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 500/- ක මුදලක් ගෙවීම අනිවාර්යය වේ. එය ලංකා බැංකුව, රෝහල පාර, කොළඹ 01, තැප්‍රොබේන් ශාඛාවේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 7042385 දරන ගිණුමට බැර වන පරිදි ගෙවා රිසිට්පත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතු ය. දෙදහස් විසිහපහ වර්ෂයේ සැප්තැම්බර් මස 26 දින (2025.09.26) අංක දරන 2456 *ගැසට් පත්‍රය* අනුව මෙම තනතුරට අයදුම් කළ අයදුම්කරුවන් රු. 500 ක සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු නොවේ. එම අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ අනු අංක 06 නිවැරදිව සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

IV. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදි සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සකසා බලනු නොලැබේ.

VI. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නිකුත් කරන ලිපි, අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VII. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු,

ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවාගෙන යොමු කළ යුතු ය.

VIII. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවත්නා **ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ජලවිද්‍යා මිනුම් සහායක තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2026" යනුවෙන් පැහැදිලිව සඳහන් කර දෙදහස් විසිහය වර්ෂයේ දෙසැම්බර් මස 11 දින (2026.12.11)** හෝ ඊට **පෙර වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතු ය.

8. සාවද්‍ය තොරතුරු සැපයීම :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අයදුම්පත්‍රය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් පත්වීම අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම :

2027 ජනවාරි මස කොළඹ දී පමණක් සිංහල හා දෙමළ මාධ්‍යවලින් සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ඉංජිනේරු පී. එම්. ජයදීර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2026, නොවැම්බර් මස 10 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම් පත්‍රය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ජල විද්‍යා මිනුම් සහායක (III) තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2026

The application for the Open Basis Recruitment to the Post of Hudrological survey Assistant (III) in the irrigation Department - 2026

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2

1. 1.1 අයදුම්කරුගේ මූලකුරු සමග නම -: .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 අයදුම්කරුගේ මුලකුරු සමග නම : .....
(සිංහලෙන්/දෙමළෙන්) .....

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම :.....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම :.....
(සිංහලෙන්/දෙමළෙන්) .....

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.6 ස්ත්‍රී/ පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ස්ත්‍රී : 1 පුරුෂ : 2 |

2. 2.1 ස්ථිර ලිපිනය .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

2.2 ස්ථිර ලිපිනය .....
(සිංහලෙන්/දෙමළෙන්) .....

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය .....
සිංහලෙන්/දෙමළෙන් .....

(ii) කැපිටල් අකුරෙන් : .....

2.4 දුරකතන අංකය (පෞද්ගලික) :- .....

3. 3.1 විවාහක/ අවිවාහක බව :

විවාහක :- 2 අවිවාහක :- 1 |

3.2 උපන් දිනය-: (අදාළ කොටුව තුළ ලියන්න)

වර්ෂය : | | | | | මාසය : | | දිනය : | |

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස -:

අවුරුදු : | | | | | මාස : | | දින : | |

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද?

.....

4. අධ්‍යාපන සුදුසුකම්: -

4.1. අ.පො.ස.(සා/පෙළ) විභාගය :

I. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : ..... මාසය : .....
II. විභාග අංකය : .....

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

4.2. අ.පො.ස.(සා/පෙළ) විභාගය :

I. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : ..... මාසය : .....
II. විභාග අංකය : .....

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

4.3. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :

.....
.....
.....
.....
.....

5. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න)

ඔව්		නැත	

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න

.....
.....

6. මෙම තනතුර සඳහා බඳවා ගැනීමට 2025.09.26 දින ගැසට් පත්‍රයේ පළකල දැන්වීම අනුව ඔබ මෙම තනතුර සඳහා 2025.10.26 දිනට පෙර අයදුම් පත්‍ර යොමු කළ අයෙක් ද
(අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න)

ඔව්		නැත	

(ඔව් නම් ඔබ විසින් රු. 500 ක අයදුම්පත් ගාස්තුව ගෙවිය යුතු නොවේ.)

6.1

i. 2025.09.26 දැන්වීම අනුව ඔබ අයදුම්කළේ නම් මුදල් ගෙවීමේ කුවිතාන්සි අංකය ..... දිනය .....

සහ/ හෝ

ii. ඔබ අයදුම්පත් ඉදිරිපත් කලේ නම් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටී

දිනය .....

6.2 මුදල් ගෙවීමේ කුවිතාන්සිය :

කුවිතාන්සි අංකය : ..... දිනය : .....

කුවිතාන්සිය මෙහි අලවන්න

7. අයදුම්කරුගේ සහතිකය :

(අ) ..... වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබ හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාරයක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි. මා මෙම තනතුරට තෝරා පත්කරගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට එකඟ වෙමි.

(ආ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තව ද, මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ මාගේ අයදුම්පත්‍රය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය-: ....,

අයදුම්කරුගේ අත්සන.

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය..... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

.....,

අත්සන සහතික කරන නිලධාරියාගේ

අත්සන සහ නිල මුද්‍රාව.

දිනය - .....

සහතික කරන නිලධාරියාගේ නම - .....

තනතුර - .....

ලිපිනය - .....

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ප්‍රාථමික අර්ධ ශිල්පීය නිලධර ගණය (පොත් බැඳුම්කරු) තනතුර III වන ශ්‍රේණියට බඳවා ගැනීම

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා පවත්නා කාර්යාලවල පොත් බැඳුම්කරු තනතුර III ශ්‍රේණියේ පුරප්පාඩු 10 ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්කිරීමේ බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්කිරීමේ බලධරයාට බලය ඇත.

03. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහතින් දක්වා ඇති ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත අදාළ සහතිකවල පිටපත් ද සමඟ බඳා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''පොත් බැඳුම්කරු තනතුර III වන ශ්‍රේණිය සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීමේ අයදුම්පත'' යනුවෙන් සඳහන් කර 2026 දෙසැම්බර් මස 11 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රෙජිස්ට්‍රාර් ජනරාල්,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො. 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

04. තනතුරේ ස්වභාවය සහ රාජකාරී ව්‍යූහය :

I. මෙම තනතුර ප්‍රාථමික මට්ටම - අර්ධ ශිල්පීය ගණයේ තනතුරකි.

II. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ.

III. ඔබ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

IV. පත්වීම භාරගත් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් විය යුතුය. බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් ආකාරයට නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතුය.

V. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් විය යුතු වේ.

05. ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන ඉදිකිරීම්, නඩත්තු හා අළුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා / කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම නිලධර ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත් කිරීමේ බලධරයා විසින් ඒ ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

06. සේවා කොන්දේසි :

I. පත්වීම ලැබූ **කාර්යාලවල වසර 03 ක් අනිවාර්යයෙන් සේවය කළ යුතු** අතර පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධරයකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

II. මෙම පත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2310/29 හා 2022.12.14 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ පොත් බැඳුම්කරු තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් කරුණු ද අදාළ වේ.

07. බඳවා ගැනීමේ සුදුසුකම් :

07.1 **පොදු කරුණු**

7.1.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

7.1.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය

සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

7.1.3 විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

7.1.4 සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතු ය.

7.1.6. තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.2 අධ්‍යාපන සුදුසුකම්

7.2.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම.

7.3 වෘත්තීය සුදුසුකම්

7.3.1 අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාවන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි අදාළ ක්ෂේත්‍රයේ (පොත් බැඳුම්කරණය) ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම.

7.4 පළපුරුද්ද

7.4.1 පොත් බැඳීමේ කටයුතු කරනු ලබන ආයතනයකින් ලබා ගත් පොත් බැඳීම පිළිබඳ අවම වශයෙන් එක් වසරක පළපුරුද්ද (එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතු ය.)

සටහන -

මෙම බඳවා ගැනීම හුදෙක් පොත් බැඳුම්කරු තනතුරෙහි රාජකාරී ඉටු කිරීම සඳහා වන බැවින්, ඉහළ අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම මත, පොත් බැඳුම්කරු තනතුරට අදාල බඳවා ගැනීම් පරිපාටියට පරිබාහිරව විධිමත් පටිපාටියකින් තොරව වෙනත් වැටුපක් ලබා ගැනීමට හෝ එබඳු වැටුප් ව්‍යුහයක වන තනතුරකට පත් කිරීමට හිමිකමක් නොමැති බව සැලකිය යුතුය.

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

තනතුරට අදාල සුදුසුකම් පරීක්ෂා කිරීමේ වෘත්තීය පරීක්ෂණයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ. අයදුම්කරුවන් අදාළ පරීක්ෂණ දෙක මඟින්ම ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පොත් බැඳුම්කරු තනතුරේ III ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

08.1 වෘත්තීය පරීක්ෂණය

8.1.1 ක්ෂේත්‍රයට අදාල ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරන ලද ආයතනයක් මඟින් වෘත්තීය පරීක්ෂණය පවත්වනු ලැබේ.

8.1.2 විභාගය පිළිබඳ විස්තර -

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*මූළු ලකුණු*	*සමත් ලකුණු*
පොත් බැඳුම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය	*පැය 02*	*100*	*40*

8.1.3 විෂය නිර්දේශය

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
පොත් බැඳුම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය	i. කඩදාසි හා ලේඛනවල තත්ත්ව පරීක්ෂාව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම ii. ලේඛන සංරක්ෂණයේ දී ගත යුතු ක්‍රියාවන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම iii. ලේඛන සංරක්ෂණයේදී භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ හඳුනා ගැනීම හා භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම

08.2 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

8.2.1 රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

8.2.2 ලකුණු ලබා දෙන පිළිවෙල -

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	20	40%
අතිරේක වෘත්තීය සුදුසුකම්	20	
පළපුරුද්ද	30	
භාෂා ප්‍රවීණතාවය	25	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව	05	
මුළු ලකුණු	**100**	

09. වැටුප :

I. වැටුප් කේතය - **PL-2-2025**

II. වැටුප් පරිමාණය, III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය - **රු. 41,800/- 10X490- 10X540- 10X590-12X630 - රු. 65,560/- කි.**

(2027.01.01 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ. එතෙක් මෙම චක්‍රලේඛයෙහි උපලේඛන III අනුව නියමිත වැටුප ගණනය කරනු ලැබේ.)

10. අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන :

I. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්,
II. ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්,
III. අධ්‍යාපන සහතිකවල, වෘත්තීය සහතිකවල සහ පළපුරුද්ද සනාථ කරන සහතිකවල සහතික කළ පිටපත්,
IV. ග්‍රාම නිලධාරී සහතිකය (DS 04 ආකෘතිය).

11. මෙම නිවේදනයේ සඳහන් **අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දට අදාළ සුදුසුකම්** ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෘත්තීය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

I. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් භිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

15. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 නොවැම්බර් මස 13 වැනි දින,
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

පොත් බැඳුම්කරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය :

සිංහල	
දෙමළ	
ඉංග්‍රීසි	

1. මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..... මයා/මිය/මෙය

2. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : Mr./ Mrs./ Miss .....

3. මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :.....

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. උපන් දිනය : වර්ෂය:

මාසය:

දිනය:

6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට(2026.12.11)වයස: අවු:

මාස:

දින:

7. ස්ථිර ලිපිනය : .....

8. පදිංචි දිස්ත්‍රික්කය : .....

9. දුරකථන අංකය :

නිවස:

පෞද්ගලික:

10. විද්‍යුත් තැපැල් ලිපිනය: .....

11. අධ්‍යාපන සුදුසුකම් :

11.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. පළමුවර ප්‍රතිඵල : වර්ෂය ..... මාසය .....

විෂයය	*ශ්‍රේණිය*	*විෂයය*	*ශ්‍රේණිය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

II. දෙවනවර ප්‍රතිඵල : වර්ෂය ..... මාසය .....

විෂයය	*ශ්‍රේණිය*	*විෂයය*	*ශ්‍රේණිය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

11.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර
විභාගයේ වර්ෂය හා මාසය : ..... විභාග අංකය : .....
ප්‍රතිඵල

විෂයය	*ශ්‍රේණිය*
1.	
2.	
3.	
4.	

12. වෘත්තීය සුදුසුකම් : .....
.....

13. තනතුර අදාළව ලබා ඇති පළපුරුද්ද : .....
.....

14. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐

.....

15. අයදුම්කරුගේ සහතිකය :

අ. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ආ. මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

ඇ. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ....,
අයදුම්කරුගේ අත්සන.

11 - 309

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2026

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 12 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සුදුස්සන් බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026/12/21** වේ.

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර පත්වීම් සහිත නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ එක් වර්ෂයක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණි.

තනත්රට බඳවා ගනු ලැබුවහොත් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය.

01. සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට (කොන්ත්‍රාත්) අදාළ රාජකාරි

නීති කෙටුම්පත් භාෂාත්‍රෙයන් සකස් කිරීම, උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සහ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළ අනෙකුත් කාර්යයන්හි නිරත වන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි නීති කෙටුම්පත් සම්පාදක සේවයේ නිලධාරීන්ට සහාය වීම හා අවස්ථානුකූලව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරියට අදාළව පවරනු ලබන කටයුතු.

02. දීමනා :

මාසික දීමනාව රු. 115,970/- හා ජීවන වියදම් දීමනාව රු. 17,800/-ක් වේ.

03. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවසන් දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය.

04. සුදුසුකම් :

4.1 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී නිබීම සහ

II. අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ට සම්මාන සාමාර්ථයක් ලබා නිබීම.

4.2 පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම්දීමෙන් පසුව වසරක (01)ට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

4.3 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

05. වෙනත්

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවෙකු වී නොතිබීම.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

I. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

	පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ		*උපරිම ලකුණු ප්‍රමාණය*
01.	**අතිරේක අධ්‍යාපන සුදුසුකම්**		
	(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක්	25	
	(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් ඇටර්නි ඩිප්ලෝමාවක්	20	
	(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද		25
	➢ පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	15	
	➢ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	10	
	➢ දෙවන පන්තියේ පහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	07	
	➢ සාමාන්‍ය සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	05	
	(ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය	10	
	(ඉ) නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය	05	
	සටහන : අතිරේක අධ්‍යාපන සුදුසුකම් අතරින් ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ඇත.		

	පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ		*උපරිම ලකුණු ප්‍රමාණය*
02.	**භාෂා ප්‍රවීණතාවය**		
	a) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය		
	(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධිය	05	
	(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ රජයේ පිලිගත් ආයතනයික්න ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3/NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS (Academic) සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ TOEFL - IBT 79 හෝ ඊට ඉහළ TOEFL - CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL - PBT 550 හෝ ඊට ඉහළ වීම.	04	10
	b) රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය (තනතුරට ඉල්ලුම් කරන භාෂාව හැර)		
	(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හි විධිවිධාන අනුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සිංහල/දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධිය	05	
	(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පුහුණු ආයතනයක සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (අවුරුදු 01 නොඅඩු)	04	
	සටහන : එක් උප ශීර්ෂයක් යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ඇත.		
03.	**අතිරේක පළපුරුද්ද**		
	තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 01 සේවා කාලයට අමතරව නීතිඥවරයෙකු / නීතිමය තනතුරටක් දරන්නෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 02 බැගින් උපරිමය ලකුණු 10 ක්		10
	සටහන :		
	I. පෞද්ගලික නීති සේවයේ යෙදෙන අයදුම්කරුවන් අවුරුදු විස්සකට (20) නොඅඩු නීතිඥ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ අධිකරණ සේවා නිලධරයකු වෙතින් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය. රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක නීතිමය තනතුරක් දරන අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධාන වෙතින් ලබාගත් සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.		
	II. සේවය ආරම්භ වන හා අවසාන වන දින නිශ්චිතව සඳහන් නොවන සේවා සහතික ලකුණු ලබාදීම සඳහා පිළිගනු නොලැබේ.		
04.	**යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**		05
	මුළු එකතුව		50

I. ඉහත සඳහන් සුදුසුකම් සනාත කරගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවස්ථාවේදී එම සහතිකවල මුල් පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන සහතික සඳහා ලකුණු ලබා දීමක් සිදු නොවේ.

II. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් සහ මූලික සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

I. සහකාර නීති කෙටුම්පත් සම්පාදක (කොන්ත්‍රාත්) තනතුරේ සේවය කරමින් සිටින කිසියම් අවස්ථාවකදී හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ වෙනත් කිසියම් අවස්ථාවකදී හෝ අපේක්ෂකයා විසින්/ ඔහු වෙනුවෙන් ලබා දී ඇති/ සපයා ඇති තොරතුරු නිවැරදි සහ බල සහිත ඒවා නොවේ යැයි හෙළි වුවහොත් කිසිදු පූර්ව දැනුම්දීමකින් හා වන්දි ගෙවීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි සේවය ලබා ගැනීම අවසන් කරනු ලැබේ.

II. සහකාර නීති කෙටුම්පත් සම්පාදක (කොන්ත්‍රාත්) තනතුරට තෝරා ගන්නා අයෙකුට එම තෝරා ගැනීම මත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් කිසිදු රජයේ ආයතනයක කිසිදු ස්ථීර තනතුරක් ලබා ගැනීමට විශේෂ හිමිකමක් නොමැත.

08. සේවා කොන්දේසි

I. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2023/29 හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ අදාළ වේ.

II. නීති කෙටුම්පත් සම්පාදක විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලටද යටත් වීමට එකඟ විය යුතුය.

09. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

ඉදිරිපත් කළයුතු අයදුම්පතෙහි ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ "සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර (කොන්ත්‍රාත්)" යනුවෙන් සඳහන් කර "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, අංක 80, අධිකරණ මාවත, කොළඹ 12" ලිපිනයට 2026/12/21 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත් සහතික කිරීම

අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථීර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතුය.

11. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

12. පුරප්පාඩු පිරවීමේ, නොපිරවීමේ හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂා පාඨයේ සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජනාධිපති නීතිඥ අයෙෂා ජීනසේන,
ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 නොවැම්බර් මස 12 වැනි දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
නො. 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

කොන්ත්‍රාත් පදනම මත සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට ඉල්ලුම් කිරීම සඳහා වූ අයදුම්පත්‍රය

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය :
(සිංහල - 1/ දෙමළ - 2/ ඉංග්‍රීසි - 3)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

1.

I. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : .....
.....

II. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) : .....

III. මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) : .....
.....

IV. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) : .....
.....

2. ස්ථිර ලිපිනය : .....

I. (සිංහලෙන්/දෙමළෙන්) : .....

II. ඉංග්‍රීසියෙන් : .....

III. දුරකථන අංකය : (නිවස) : ..... (ජංගම) : .....

03. උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | |

04. 2026.12.21 දිනට (අයදුම්පත් කැඳවන අවසන් දිනට) වයස :

අවුරුදු : | | | | | මාස : | | | දින: | |

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

06. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 0 පුරුෂ - 1 | |
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද : ඔව් -1 නැත -2 | |
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :

I. අ.පොෂ.ස. (සා/පෙළ)
වර්ෂය : ..... විභාග අංකය .....

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*

II. අ.පොෂ.ස. (උ/පෙළ)
වර්ෂය : ..... විභාග අංකය .....

විෂයය	*සාමාර්ථය*

III. ලබා ඇති උපාධි පිළිබඳ විස්තර :

විශ්වවිද්‍යාලය/ ආයතනය	*ක්ෂේත්‍රය*	*වලංගු දිනය*

IV. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව ලබා ඇති සක්‍රීය වෘත්තීය පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් දිනය	*වෘත්තීය පළපුරුද්ද ලබා ගත් ආයතනය*	*කාල සීමාව*	
		සිට	*දක්වා*

09. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාලය/ ආයතනය	*ක්ෂේත්‍රය*	*සාමාර්ථය*	*වලංගු දිනය*

10. භාෂා ප්‍රවීණතාවය :

විශ්වවිද්‍යාලය/ ආයතනය	*ක්ෂේත්‍රය*	*සාමාර්ථය*	*වලංගු දිනය*

11. අතිරේක පළපුරුද්ද :

අතිරේක පළපුරුද්ද ලබා ගැනීමට සේවය කළ ආයතනය	*කාල සීමාව*	
	සිට	*දක්වා*

12. අධිකරණයේ ඉදිරියේ ඔබ කෙදිනක හෝ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද? ඔව්/ නැත ඔව් නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

.....

.....

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය හා වැරදි සහගත බව මා පත් කරනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම් ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත් මගේ සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

දිනය :..... .....,

අයදුම්කරුගේ අත්සන.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ජාතික හැඳුනුම්පත් අංක ..... දරන .... මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු/ ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :..... .....,

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම : .....

තනතුර : .....

ලිපිනය : .....

විභාග - විභාග ප්‍රතිඵල ආදිය

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2027 ජනවාරි මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාග නීති උල්ලංඝනය කළහොත් විනය බලධාරියා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඇතුළත් කරනු ලබන සියලු තොරතුරුවල නිරවද්‍යතාවය තමා විසින් සහතික විය යුතු අතර, ඉන් සිදුවිය හැකි යම් අගතියක් වේ නම් අයදුම්කරු විසින් එහි වගකීම දැරිය යුතු ය.

3.0 සුදුසුකම්.- මේ වන විට ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ I ශ්‍රේණියට උසස් කරන ලද නිලධාරීන් මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට සුදුසුකම් ලබයි.

4.0 මෙම විභාගය සඳහා අයදුම්කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත (online) ක්‍රමයට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් කළ හැක. වෙබ් අඩවියේ මුල් පිටුවේ ඉහළ දිස්වන "Apply for Examinations" දිගුව ඔස්සේ හෝ සෘජුව https://examinationportal.slida.lk/දිගුව ඔස්සේ විභාග ද්වාරය (Examination Portal)වෙත පිවිස පරිශීලක ගිණුමක් (User Account) සකස් කර ගත යුතු අතර, ඉන්පසු අදාළ විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැක.

මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය.

විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම 2026.11.20 දින පෙ.ව.8.00 සිට 2026.12.04 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

අයදුම් කිරීමේ පියවර සඳහන් උපදෙස් ලේඛනය www.slida.lk වෙබ් අඩවියේ විභාග ද්වාරය (Examination Portal) වෙත පිවිසීමෙන් PDF ආකාරයෙන් බාගත කර ගත හැකි අතර, අයදුම් කිරීමට පෙර අදාළ උපදෙස් පරිශීලනය කරන ලෙස අයදුම්කරුවන් වෙත දැනුම්දෙනු ලැබේ.

5.0 i. විභාග ගාස්තු.- පළමුවන වරට මෙම විභාගයට අයදුම් කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක් විෂයයකට රු.250/-ක් බැගින් ගෙවිය යුතු වේ.

ii. විභාග ගාස්තු පහත දැක්වෙන ගිණුම වෙත බැර කළ යුතු වේ.

ගිණුමේ නම - ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය
ගිණුම් අංකය - 7040519
බැංකුව - ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාව

iii. එම ගෙවීමට අදාළව ලබා දෙන මුදල් තැන්පතු පතේ අංකය අයදුම්පතට ඇතුළත් කළ යුතු අතර මුදල් තැන්පතු පතේ ඡායාරූපයක් විභාග අයදුම්පතේ අදාළ ස්ථානයට උඩුගත (Upload) කළ යුතු ය.

iv. තව ද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් ගෙවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, මුදල් තැන්පත් කිරීමට හේතුව යන ස්ථානයේ විභාගයේ නම ද ඇතුළත් කර මුදල් තැන්පතු පත සම්පූර්ණ කළ යුතු ය. මාර්ගගත(online) ක්‍රමයට මුදල් ගෙවන නිලධාරීන් ද ලැබෙන රිසිට්පතේ ඉහත තොරතුරු සටහන් කළ යුතු ය.

6.0 මාර්ගගත ක්‍රමයට අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අයදුම්කරු සතුව සක්‍රීය විද්‍යුත් තැපැල් (email) ලිපිනයක් හා ජංගම දුරකතන අංකයක් පැවැතීම අනිවාර්යය වේ. අයදුම්කිරීමේ දී එක් විද්‍යුත් තැපැල් ලිපිනයක් භාවිතා කළ හැක්කේ එක් පරිශීලක ගිණුමක් සඳහා පමණි.

අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කළ පසු අසම්පූර්ණ (Draft)අයදුම්පත්‍ර සම්පූර්ණ කර ඉදිරිපත් කරන තෙක් තහවුරු කිරීමේ පණිවුඩයක් යොමු නොකෙරෙන අතර, සම්පූර්ණ කර ඉදිරිපත් කළ අයදුම්පත්‍ර සඳහා පමණක් තහවුරු කිරීමේ පණිවුඩයක් ඔබ විසින් ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට හා ජංගම දුරකථන අංකයට යොමු කෙරෙනු ඇත.

ඉහත තහවුරු කිරීමේ පණිවිඩය ලැබුණු පසු තම අයදුම්පත්‍රයේ පිටපතක් බාගත කර (Download) තමා

සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත කඩිනමින් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා අනන්‍යතාවය පිළිබඳ තොරතුරු මා විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

නියමිත දිනට සම්පූර්ණ කර යොමු කිරීමට නොහැකිවන අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීමේ කාල සීමාවන් අවසන් වූ පසු විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබන අතර, ඔබගේ විද්‍යුත් තැපෑල වෙත පිවිස විභාග ප්‍රවේශ පත්‍රය බාගත (Download) කරගත හැක.

7.0 මාර්ගගතව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් තාක්ෂණික ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තාක්ෂණික අංශයේ 011-4513366 හා 011-4513368 යන දුරකථන අංකද, අනෙකුත් විමසීම් සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාම නිලධාරී පාලන අංශයේ 011- 2050372, 011-2050373 යන දුරකථන අංක ද, සතියේ වැඩ කරන දිනවල පෙ.ව.8.30 සිට ප.ව.4.30 දක්වා විවෘතව ඇත.

8.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

9.0 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමැති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමර්ථයන් සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලු විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

13.0 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15.0 විභාග පටිපාටිය : අපේක්ෂකයින් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

වගු අංක 01 : විභාගය පැවැත්වෙන විෂයයන් සහ අදාළ වන අනෙකුත් විස්තර

විෂයය	*විෂය අංකය*	*ලකුණු*	*කාලය*	*සමත් ලකුණු*
කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය	01	100	පැය 01 ½	40%
විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම	02	100	පැය 01 ½	40%

16.1 කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය (විෂය අංකය - 01)

(*අ*) කාර්යාල ක්‍රම

රජයේ කාර්යාලවල හා ග්‍රාම නිලධාරී කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.

(*ආ*) රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති අනුව විනය බලතල බෙදී ඇති ආකාරය, සේවය අවසන් කිරීම, විශ්‍රාම ගැන්වීමට අදාළ රීති හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සාමාන්‍ය හැසිරීම හා විනය ක්‍රියා පටිපාටියට අදාළ XLVII හා XLVIII පරිච්ඡේදයන්හි සඳහන් විධිවිධාන හා ඒ සම්බන්ධව තත්කාලීනව නිකුත් කර ඇති චක්‍රලේඛ පිළිබඳ ඇති දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කෙරේ.

16.1.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වන කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25)

II වන කොටස - ප්‍රශ්න පහකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පහටම පිළිතුරු සැපයිය යුතු ය. කාලය පැය 01යි. (ලකුණු 75යි)

16.2 විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම (විෂය අංකය - 02)

ග්‍රාම නිලධාරීන්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් ව්‍යාවස්ථාපිත රජයේ ආයතන මගින් පැවරී ඇති රාජකාරී පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර එම විෂයයන්ට අදාළ සිද්ධීන් සම්බන්ධව සිද්ධි අධ්‍යනයෙන් සමන්විත වේ.

16.2.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වන කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25)

II වන කොටස - ප්‍රශ්න පහකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පහටම පිළිතුරු සැපයිය යුතු ය. කාලය පැය 01යි. (ලකුණු 75යි)

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 නොවැම්බර් මස 13 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැදුර,ඇල්විටිගල මාවත,
කොළඹ 05.

උපලේඛන I

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයත් දිස්ත්‍රික්කය හා අංකය*	*අයත් පළාත හා අංකය*
කොළඹ	1103	01 කොළඹ	01 බස්නාහිර පළාත
කොළොන්නාව	1106		
කඩුවෙල	1109		
හෝමාගම	1112		
සීතාවක (හංවැල්ල)	1115		
පාදුක්ක	1118		
මහරගම	1121		
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	1124		
තිඹිරිගස්යාය	1127		
දෙහිවල	1130		
රත්මලාන	1131		
මොරටුව	1133		
කැස්බෑව	1136		
මීගමුව	1203	02 ගම්පහ	
කටාන	1206		
දිවුලපිටිය	1209		
මීරිගම	1212		
මිනුවන්ගොඩ	1215		
වත්තල	1218		
ජා ඇල	1221		
ගම්පහ	1224		
අත්තනගල්ල	1227		
දොම්පේ	1230		
මහර	1233		
කැලණිය	1236		
බියගම	1239		
පානදුර	1303	03 කළුතර	
බණ්ඩාරගම	1306		
හොරණ	1309		
ඉංගිරිය	1310		
බුලත්සිංහල	1312		
මදුරාවල	1315		
මිල්ලනිය	1318		
කළුතර	1321		
බේරුවල	1324		
දොඩන්ගොඩ	1327		
මතුගම	1330		
අගලවත්ත	1333		
පාලින්දනුවර	1336		
වලල්ලාවිට	1339		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයත් දිස්ත්‍රික්කය හා අංකය*	*අයත් පළාත හා අංකය*
තුම්පනේ	2103	04 මහනුවර	02 මධ්‍යම පළාත
පූජාපිටිය	2106		
අකුරණ	2109		
පාතදුම්බර	2112		
පන්විල	2115		
උඩුදුම්බර	2118		
මිනිපේ	2121		
මැදදුම්බර	2124		
කුණ්ඩසාලේ	2127		
ගහවට කෝරළේ	2130		
හාරිස්පත්තුව	2133		
හතරලියද්ද	2134		
යටිනුවර	2136		
උඩුනුවර	2139		
දොළුව	2142		
පාතහේවාහැට	2145		
දෙල්තොට	2148		
උඩපළාත	2151		
ගහඉහළ කෝරළේ	2154		
පස්බාගෙ කෝරළේ	2157		
ගලේවෙල	2203	05 මාතලේ	
දඹුල්ල	2206		
නාඋල	2209		
පල්ලේපොල	2212		
යටවත්ත	2215		
මාතලේ	2218		
අඹන්ගහ කෝරළේ	2221		
ලග්ගල පල්ලේගම	2224		
විල්ගමුව	2227		
රත්තොට	2230		
උකුවෙල	2233		
කොත්මලේ	2303	06 නුවරඑළිය	
කොත්මලේ බටහිර	2304		
හඟුරන්කෙත	2306		
මතුරට	2307		
වලපනේ	2309		
නිල්දණ්ඩාහින්න	2310		
තලවකැලේ	2313		
අඹගමුව	2315		
නෝර්වූඩ්	2316		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයන් දිස්ත්‍රික්කය හා අංකය*	*අයන් පළාත හා අංකය*
බෙන්තොට	3103	07 ගාල්ල	03 දකුණු පළාත
බලපිටිය	3106		
කරන්දෙණිය	3109		
ඇල්පිටිය	3112		
නියාගම	3115		
තවලම	3118		
නෙළුව	3121		
නාගොඩ	3124		
බද්දේගම	3127		
වදුරඹ	3128		
වැලිවිටිය දිවිතුර	3130		
අම්බලන්ගොඩ	3133		
හික්කඩුව	3136		
රත්ගම	3137		
මාදම්පාගම	3138		
කඩවත්සතර	3139		
බෝපෙ පෝද්දල	3142		
අක්මීමන	3145		
යක්කලමුල්ල	3148		
ඉමදුව	3151		
හබරාදුව	3154		
ගෝනපීනුවල	3157		
පිටබැද්දර	3203	08 මාතර	
කොටපොල	3206		
පස්ගොඩ	3209		
මුලටියන	3212		
අතුරලිය	3215		
අකුරැස්ස	3218		
වැලිපිටිය	3221		
මාලිම්බඩ	3224		
කඹුරුපිටිය	3227		
හක්මන	3230		
කිරින්ද පුහුල්වැල්ල	3233		
නිහගොඩ	3236		
වැලිගම	3239		
මාතර	3242		
දෙවිනුවර	3245		
දික්වැල්ල	3248		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයන් දිස්ත්‍රික්කය හා අංකය*	*අයන් පළාත හා අංකය*
සූරියවැව	3303	09 හම්බන්තොට	03 දකුණු පළාත
ලුණුගම්වෙහෙර	3306		
තිස්සමහාරාමය	3309		
හම්බන්තොට	3312		
අම්බලන්තොට	3315		
අඟුණකොළපැලැස්ස	3318		
වීරකැටිය	3321		
කටුවන	3324		
ඕකේවෙල	3327		
බෙලිඅත්ත	3330		
තංගල්ල	3333		
වලස්මුල්ල	3336		
කයිට්ස්	4103	10 යාපනය	04 උතුරු පළාත
වානක්කනි	4106		
සන්දිලිපායි	4109		
තෙලිප්පායි	4112		
උඩුවිල්	4115		
කෝපායි	4118		
කරවෙඩ්ඩි	4121		
මුරුදන්කර්නි	4124		
පේදුරුතුඩුව	4127		
වාවාකච්චේරි	4130		
නල්ලූර්	4133		
යාපනය	4136		
වෙලනෙ	4139		
ඩෙල්ෆ්	4142		
කරෙයිනගර්	4145		
මන්නාරම	4203	11 මන්නාරම	
මාන්තායි බටහිර	4206		
මඩු	4209		
නානට්ටාන්	4212		
මුසාලි	4215		
වවුනියා උතුර	4303	12 වවුනියා	
වවුනියා දකුණ	4306		
වවුනියා	4309		
වෙන්ගලච්චේඩිකුලම්	4312		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයත් දිස්ත්‍රික්කය හා අංකය*	*අයත් පළාත හා අංකය*
තුනුක්කායි	4403	13 මුලතිව්	04 උතුරු පළාත
මාන්තායි නැගෙනහිර	4406		
පුදුකුඩියිරුප්පු	4409		
ඔඩ්ඩුසුඩාන්	4412		
මැරිටයිම්පත්තු	4415		
වැලිඔය	4418		
පච්චිලෙයිපල්ල	4503	14 කිලිනොච්චිය	
කඳවලෙයි	4506		
කරච්චි	4509		
පූනකරි	4512		
කෝරළේපත්තු උතුර	5103	15 මඩකලපුව	05 නැගෙනහිර පළාත
කෝරළේපත්තු බටහිර	5106		
කෝරළේපත්තු	5109		
එරාවුර්පත්තු	5112		
එරාවූර්නගරය	5115		
මන්මුනේ උතුර	5118		
මන්මුනේ බටහිර	5121		
කාත්තන්කුඩි	5124		
මන්මුනේපත්තු	5127		
මන්මුනේ නිරිත	5130		
පෝර්තිව්පත්තු	5133		
මන්මුනේ දකුණ	5136		
කෝරළේපත්තු දකුණ	5139		
කෝරළේපත්තු මධ්‍යම	5142		
දෙහිඅත්තකණ්ඩිය	5203	16 අම්පාර	
පදියතලාව	5206		
මහඔය	5209		
උහන	5212		
අම්පාර	5215		
නාවින්දවේලි	5216		
සමන්තුරෙයි	5218		
කල්මුණේ	5224		
සයින්ද මාරුදු	5225		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයත් දිස්ත්‍රික්කය හා අංකය*	*අයත් පළාත හා අංකය*
කාර්තිවු	5227	16 අම්පාර	05 නැගෙනහිර පළාත
නින්දවූර්	5230		
අඩ්ඩාලච්චේන	5233		
ඉරක්කාමම්	5234		
අක්කරෙයිපත්තුව	5236		
ආලයඩිවෙම්බු	5239		
දමන	5242		
තිරුක්කෝවිල්	5245		
පොතුවිල්	5248		
ලාහුගල	5251		
කල්මුණ උතුර උප	5254		
පදවි ශ්‍රී පුර	5303	17 ත්‍රිකුණාමලය	
කුච්චවේලි	5306		
ගෝමරන්කඩවල	5309		
මොරවැව	5312		
නගර හා කඩවත්	5315		
තඹලගමුව	5318		
කන්තලේ	5321		
කින්නියා	5324		
මුතූර්	5327		
සේරුවිල	5330		
වෙරගල්/ ඉච්චලම්පත්තු	5333		
ගිරිබාව	6103	18 කුරුණෑගල	06 වයඹ පළාත
ගල්ගමුව	6106		
ඇහැටුවැව	6109		
අඹන්පොල	6112		
කොටවෙහෙර	5115		
රස්නායකපුර	6118		
නිකවැරටිය	6121		
මහව	6124		
පොල්පිතිගම	6127		
ඉබ්බාගමුව	6130		
ගනේවත්ත	6133		
වාරියපොල	6136		
කොබෙයිගනේ	6139		
බිංගිරිය	6142		
බමුණාකොටුව	6149		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයන් දිස්ත්‍රික්කය හා අංකය*	*අයන් පළාත හා අංකය*
මාස්පොත	6151	18 කුරුණෑගල	06 වයඹ පළාත
කුරුණෑගල	6154		
මල්ලවපිටිය	6157		
මාවතගම	6160		
රිදීගම	6163		
වීරඹුගෙදර	6166		
කුලියාපිටිය නැගෙනහිර	6169		
කුලියාපිටිය බටහිර	6172		
උඩුබද්දාව	6175		
පන්නල	6178		
නාරම්මල	6181		
අලව්ව	6184		
පොල්ගහවෙල	6187		
පඬුවස්නුවර නැගෙනහිර	6190		
පඬුවස්නුවර බටහිර	6193		
කල්පිටිය	6203	19 පුත්තලම	
වනාතවිල්ලුව	6206		
කරුවලගස්වැව	6209		
නවගත්තේගම	6212		
පුත්තලම	6215		
මුන්දලම	6218		
මහකුඹුක්කඩවල	6221		
ආණමඩුව	6224		
පල්ලම	6227		
ආරච්චිකට්ටුව	6230		
හලාවත	6233		
මාදම්පෙ	6236		
මහවැව	6239		
නාත්තන්ඩිය	6242		
වෙන්නප්පුව	6245		
දංකොටුව	6248		
පදවිය	7103	20 අනුරාධපුරය	07 උතුරු මැද පළාත
කැබිතිගොල්ලෑව	7106		
මැදවච්චිය	7109		
මහවිලච්චිය	7112		
මධ්‍යම නුවරගම්පළාත	7115		
රඹෑව	7118		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයත් දිස්ත්‍රික්කය හා අංකය*	*අයත් පළාත හා අංකය*
කහටගස්දිගිලිය	7121	20 අනුරාධපුරය	07 උතුරු මැද පළාත
හොරොව්පොතාන	7124		
ගලෙන්බිදුනුවැව	7127		
මිහින්තලේ	7130		
නැගෙනහිර නුවරගම්පළාත	7133		
නාච්චදූව	7136		
නොච්චියාගම	7139		
රාජාංගනය	7142		
තඹුත්තේගම	7145		
තලාව	7148		
තිරප්පනේ	7151		
කැකිරාව	7154		
පළුගස්වැව	7157		
ඉපලෝගම	7160		
ගල්නෑව	7163		
පලාගල	7166		
හිඟුරක්ගොඩ	7203	21 පොළොන්නරුව	
මැදිරිගිරිය	7206		
ලංකාපුර	7209		
වැලිකන්ද	7210		
දිඹුලාගල	7212		
තමන්කඩුව	7215		
ඇලහැර	7218		
මහියංගණය	8103	22 බදුල්ල	08 ඌව පළාත
රිදීමාලියද්ද	8106		
මීගහකිවුල	8109		
කන්දෙකැටිය	8112		
සොරණාතොට	8115		
පස්සර	8118		
ලුණුගල	8119		
බදුල්ල	8121		
හාලිඇල	8124		
ඌව පරණගම	8127		
වැලිමඩ	8130		
බණ්ඩාරවෙල	8133		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයන් දිස්ත්‍රික්කය හා අංකය*	*අයන් පළාත හා අංකය*
ඇල්ල	8136	22 බදුල්ල	08 ඌව පළාත
හපුතලේ	8139		
හල්දුම්මුල්ල	8142		
බිබිල	8203	23 මොණරාගල	
මඩුල්ල	8206		
මැදගම	8209		
සියඹලාණ්ඩුව	8212		
මොණරාගල	8215		
බඩල්කුඹුර	8218		
බුත්තල	8221		
වැල්ලවාය	8224		
කතරගම	8227		
තණමල්විල	8230		
සෙවණගල	8233		
ඇහැලියගොඩ	9103	24 රත්නපුර	09 සබරගමුව පළාත
කුරුවිට	9106		
කිරිඇල්ල	*9109*		
රත්නපුර	9112		
ඉඹුල්පෙ	9115		
බලංගොඩ	9118		
කල්තොට	9119		
ඕපනායක	9121		
පැල්මඩුල්ල	9124		
ඇලපාත	9127		
අයගම	9130		
කලවාන	9133		
නිවිතිගල	9136		
කහවත්ත	9139		
ගොඩකවෙල	9142		

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය*	*අයත් දිස්ත්‍රික්කය හා අංකය*	*අයත් පළාත හා අංකය*
වැලිගෙපොල	9145	24 රත්නපුර	
ඇඹිලිපිටිය	9148		
කොලොන්න	9151		
රඹුක්කන	9203	25 කෑගල්ල	
මාවනැල්ල	9206		
අරණායක	9209		
කෑගල්ල	9212		
ගලිගමුව	9215		
වරකාපොල	9218		
රුවන්වැල්ල	*9221*		
බුලත්කොහුපිටිය	9224		
යටියන්තොට	9227		
දෙහිඕවිට	*9230*		
දැරණියගල	9233		

11 - 298

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත තරග විභාගය - 2026

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් තෝරා ගැනීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් **2027 පෙබරවාරි** මස කොළඹ දී පවත්වනු ලබන තරග විභාගය සඳහා, සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications- Recruitment/E.B.Exams" ඔස්සේ පළකළ ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **අයදුම්පත් භාර ගැනීම 2026 නොවැම්බර් මස 23 පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් මස 22 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.**

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

2. යෝග්‍යතාව :-

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු අතර, අයදුම්කරු විවාහක නම් කලත්‍රයා ද ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(*ආ*) ඉංග්‍රීසි ලඝුලේඛනය හා පරිගණක කටයුතු පිළිබඳ හැකියාව ඇති කළමනාකරණ සේවා නිලධාරී සේවයේ හා පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I/II/III ශ්‍රේණිවල නිලධාරීන් සහ රාජ්‍ය සංස්ථා, රාජ්‍ය බැංකු සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය සේවයේ නියුතු ස්ථීර නිලධාරීන් විය යුතු ය.

(*ඇ*) යටත් පිරිසෙයින් වසර 05ක ස්ථීර හා අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කර තිබිය යුතු වන අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ අදාළ සියලු වාර්ෂික වැටුප් වර්ධක නියමිත දිනට උපයා තිබිය යුතු ය.

(*ඈ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 57 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව, 1969 දෙසැම්බර් 22 දිනෙන් පසුව උපත ලද අය පමණක් මේ සඳහා අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබති.)

(*ඉ*) අපේක්ෂකයා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට මාරු කිරීමේදී සහ දූත මණ්ඩල තනතුරකට පත්කිරීමේදී ක්‍රියාකාරී සේවයේ සිටිය යුතු ය.

(*ඊ*) අවවාද කිරීමක් හැර, වෙනත් කිසිදු ආකාරයක විනය දණ්ඩනයකට යටත් වී නොතිබිය යුතු ය.

(*උ*) අයදුම්කරු විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරක මීට පෙර සේවය කර ඇත්නම්, ඔහු/ඇය එම සේවය අවසන් කර නැවත විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ සේවයට වාර්තා කළ දින සිට අවම වශයෙන් වසර තුනක් (03) සම්පූර්ණ කර තිබිය යුතු ය.

සටහන :-

I. අර්ධ රාජ්‍ය ආයතන/ බැංකුවලින් අයදුම් කරන්නන් සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් විසින් අපේක්ෂකයා සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය අතර අත්සන් කරන ලද ගිවිසුමට අනුව දූත මණ්ඩලයේ / තනතුරේ රාජකාරී භාරගත් දින සිට වසර 3ක් සඳහා අපේක්ෂකයාව නිදහස් කිරීමට නිර්දේශ (සහතික) කළ යුතු ය.

II. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල දැනට සේවය කරන නිලධාරීන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.

III. ඉහත 02 (ආ) යටතේ වන සේවාවන්හි කොන්ත්‍රාත්, අනියම් හෝ තාවකාලික පදනම මත සේවය කරන නිලධාරීන්ට උක්ත විභාගය සඳහා අයදුම් කළ නොහැක.

IV. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සහිත සහ මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ ක්‍රියාවලියෙහි දී සාර්ථක වූ අයදුම්කරුවන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට අනුයුක්ත කළ ද විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සමඟ එළඹෙන සම්පූර්ණ ගිවිසුම් කාලසීමාව ද ඇතුළත්ව පෙර තමන් සේවයේ නියුතු වූ ආයතනයේ අනිවාර්යයෙන් ම ස්ථීර සේවා නියුක්තිකයන් විය යුතු ය.

3. තෝරා ගන්නා ක්‍රමය :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් හා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන ප්‍රායෝගික ඇගයීම හා සම්මුඛ පරීක්ෂණය මගින් තෝරා ගනු ලැබේ.

3.1 ලිඛිත පරීක්ෂණය: ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

පරීක්ෂණය	*කාලය*	*ලකුණු*	*අවම ලකුණු*
ඉංග්‍රීසි ලඝුලේඛනය	*පැය 1*	*100*	*40*
ඉංග්‍රීසි සහ ව්‍යාපාර සන්නිවේදනය	*පැය 1*	*100*	*40*

සටහන:-

i. **ඉංග්‍රීසි ලඝුලේඛනය:** අයදුම්කරුවන් ඉංග්‍රීසි ලඝුලේඛනය පිළිබඳ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය කොළඹදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන ලඝුලේඛන වේගය වනුයේ මිනිත්තුවකට වචන 60 කි. මෙම ඉංග්‍රීසි ලඝුලේඛන පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ලබාදෙනු ලැබේ.

ii. **ඉංග්‍රීසි හා ව්‍යාපාර සන්නිවේදනය:** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ ලිපි/ ලිඛිත පණිවුඩ/රැස්වීම් වාර්තා කෙටුම්පත් කිරීම, ආරාධනා පත්‍ර ලිවීම යනාදිය සම්බන්ධයෙන් සහ ව්‍යාකරණ සහ අවබෝධය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම මෙමගින් සිදු කෙරේ.

3.2 ප්‍රායෝගික ඇගයීම :

	කාලය	*ලකුණු*	*අවම ලකුණු*
ප්‍රායෝගික ඇගයීම	*මිනිත්තු 80*	*60*	*24*

සටහන:-

ප්‍රායෝගික ඇගයීම, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව මූලිකකරගත් ලිපි/Memo ලිවීම, වාර්තා ලිවීම, ආරාධනා පත්‍ර සැකසීම, ඊ මේල් පණිවුඩ යැවීම පිළිබඳ ඇගයීම හා MS Office යෙදවුම භාවිතය පිළිබඳ දැනුම හා අන්තර්ජාල භාවිතය පිළිබඳ දැනුම ඇගයීම සඳහා සැලසුම් කෙරේ.
(එක් ප්‍රශ්නයකට ලකුණු 15ක් බැගින් හිමි වේ. මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.) (15 x 4)

3.3 සම්මුඛ පරීක්ෂණය

3.3.1 විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාදෙන උපරිම ලකුණු සංඛ්‍යාව 40 කි. අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පටිපාටිය විස්තරාත්මක වශයෙන් පහත දැක්වේ :-

අංකය	*ලකුණු ලබා දීමේ නිර්ණායක*	*ලකුණු ලැබෙන පිළිවෙළ*	*උපරිම ලකුණු ප්‍රමාණය*
01.	අතිරේක අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල හෝ උපාධි පිරිනමනු ලබන ආයතනයක් විසින් ලබා දෙන, I. පළමු පෙළ සාමර්ථ්‍යයක් සහිත මූලික උපාධියක් II. දෙවන පෙළ ඉහළ සාමර්ථ්‍යයක් සහිත මූලික උපාධියක් III. දෙවන පෙළ පහළ සාමර්ථ්‍යයක් සහිත මූලික උපාධියක් IV. සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිත මූලික උපාධියක් *සටහන:* 1. උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කළ යුතුය. 2. උපාධියේ අධ්‍යයන කාල සීමාව වසර 3කට නොඅඩු විය යුතුය.	 05 04 03 02	05
02.	විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයීය කටයුතු සඳහා සෘජුව අදාළ වන අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් (ජාත්‍යන්තර සබඳතා, නීතිය, ඉංග්‍රීසි හෝ වෙනත් විදේශීය භාෂා, තොරතුරු තාක්ෂණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය හා ව්‍යාපාර අධ්‍යනය, CIM, CIMA, AAT වෙනත්) I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් පශ්චාත් උපාධියක්,	 10	10

අංකය	*ලකුණු ලබා දීමේ නිර්ණායක*	*ලකුණු ලැබෙන පිළිවෙළ*	*උපරිම ලකුණු ප්‍රමාණය*
02.	II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ CIM, CIMA හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක අවසාන පරීක්ෂණය හෝ ඊට ඉහළ සුදුසුකම්.	07	
	III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉහත විෂය ක්ෂේත්‍රයන් සඳහා පිරිනමනු ලබන ඩිප්ලෝමා සහතිකය.	05	
	IV. මාස 6කට නොඅඩු කාලයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින්, පිළිගත් තාක්ෂණික විද්‍යාලයකින්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන සහතික පත්‍ර පාඨමාලාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉහත විෂය ක්ෂේත්‍රයන් සඳහා පිරිනමනු ලබන සහතික පත්‍ර පාඨමාලාව හෝ AAT සුදුසුකම.	03	
03.	සේවා පළපුරුද්ද : මුල් වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය හැර ඉතිරි මුළු සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 0.4 බැගින්		10
04.	සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය :		15
	I. සන්නිවේදන කුසලතා සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව	05	
	II. ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනුම	03	
	III. සංස්කෘතික සංවේදීතාව	03	
	IV. ධනාත්මක ආකල්ප	03	
	V. පෞරුෂත්වය හා මනා සූදානම	01	
	මුළු ලකුණු		**40**

සටහන:- *නිලධාරියා/නිලධාරිනිය ඉහත සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සම්පූර්ණ කළ යුතු වේ.*

3.4 ලිඛිත පරීක්ෂණයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගික ඇගයීමට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති. එසේ වුවද, ලිඛිත පරීක්ෂණයේ දී ඉහත සඳහන් ලකුණු ප්‍රමාණය ලබා ගන්නා සුදුසුකම්ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී, ප්‍රායෝගික ඇගයීම සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් තීරණය කිරීම සඳහා අදාළ ලිඛිත පරීක්ෂණයේ කඩඉම් ලකුණු මට්ටම තීරණය කිරීමේ අවසන් බලය විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ. ප්‍රායෝගික ඇගයීම සඳහා වූ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් (60 x 40% = 24) අයදුම්කරුවන් විසින් ලබාගැනීම ද අනිවාර්ය වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාගත යුතු අවම ලකුණු සීමාවක් නොමැත.

3.5 ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව තෝරා ගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගික ඇගයීම සඳහා කැඳවනු ලැබේ.

3.6 ඒ අනුව ලිඛිත පරීක්ෂණය සමත්ව ප්‍රායෝගික ඇගයීම, සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් සපුරාලන සියලුම අපේක්ෂකයන්ගේ නම් ලැයිස්තුව අකාරාදි/ විභාග අංක පිළිවෙළට සකසා විභාග කොමසාරිස් ජනරාල් විසින් විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශ ලේකම් වෙත ලබාදෙනු ඇත.

ප්‍රායෝගික ඇගයීම සමත් අපේක්ෂකයන්ගේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව, එම එක් එක් අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ලිඛිත පරීක්ෂණයේ දී, ප්‍රායෝගික ඇගයීමේදී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා සමුච්චිත ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව සැකසූ මුළු ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශ ලේකම් වෙත එවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගේ යෝග්‍යතාව හා අවශ්‍ය ලියකියවිලිවල සත්‍යතාව පරීක්ෂා කරනු ලැබේ.

3.7 එම මුළු ප්‍රතිඵල ලේඛනයේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 80% ක ප්‍රතිශතයක් පළමු වරට මෙම විභාගයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන්ගෙන් ද, 20% ක ප්‍රතිශතයක් ඊට පෙර දූත මණ්ඩලවල සේවය කර ඇති අපේක්ෂකයන්ගෙන් ද මෙම තනතුර සඳහා වන පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තෝරාගනු ලැබේ.

3.8 තෝරාගත් අයදුම්කරුවන් පත්කරනු ලබන දූත මණ්ඩලය පිළිබඳ අවසන් තීරණය විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් ගනු ලැබේ.

3.9. අවසාන ලකුණු නිර්ණය කිරීමේදී ඇතිවන විෂමතාවන් වැළැක්වීම සඳහා ඕනෑම කොටසකට වෙන්කර ඇති ලකුණු පූර්ණ සංඛ්‍යාවලින් (දශම සංඛ්‍යාවලින් තොරව) විය යුතු ය.

3.10 ඊට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk යන වෙබ් අඩවියේ පළ කිරීමෙන් පසු ලබා ගත හැකිය. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

3.11 විභාගය සමත් අයදුම්කරුවන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට මුදාහරින ලෙස දන්වා යැවූ විට එම අයදුම්කරුවන් නියමිත දිනට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැඩ භාර ගත යුතුය. යම් හෙයකින් නියමිත දිනට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැඩ භාර ගැනීමට අපොහොසත් වුවහොත් ඒ බව විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ලේකම් වෙත ලිඛිතව දැන්විය යුතු වන අතර, වැඩ භාර ගැනීමට නියමිත දින සිට සති හතරක කාලයක් ඇතුළත විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ සේවයට වාර්තා කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්, ලේකම්ගේ අභිමතය පරිදි පත්වීමක් භාර ගැනීමට නුසුදුසු අය සේ සලකා කටයුතු කරනු ඇත. තව ද තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පත්වීම් ලිපි නිකුත් කර සති දෙකක් ඇතුළත පත්වීම භාර ගන්නේද නැද්ද යන වග විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව දැන්විය යුතු අතර, එසේ නොවන අවස්ථාවක පත්වීම භාර නොගන්නා අයකු සේ සලකා කටයුතු කරනු ලැබේ.

4. අයදුම්කිරීම හා අයදුම්පත් එවිය යුතු පිළිවෙළ:-

I. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත් සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත් පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානින් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක්, සේවය සනාථ කිරීමේ ලිපියක් සහ වර්තමාන තනතුරෙන් මුදා හැරිය හැකි බවට ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

5. විභාග ගාස්තු:-

(අ) විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු

ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීයකර ඇති ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the facility of internet transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම (Online Banking Method/ Flex App of the Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any branch of the Bank of Ceylon).

සටහන :-

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීමේ ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවනු ලබන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

6. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍ර -

6.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත / විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ තැපැල් කුවිතාන්සිය ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

6.2 විභාග ප්‍රවේශ පත්‍රයෙහි අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු /ඇය විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවාගත යුතු ය. තව ද, විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

6.3 සෑම අපේක්ෂකයකුම තමාට නියම කොට ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති රීති මාලාවක් *ගැසට්* මගින් ප්‍රකාශයට පත්කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

6.4 අපේක්ෂකයකු වෙත විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම, ඔහු හෝ ඇය තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

6.5 විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාව වන විට අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

7. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:-

7.1 අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

8. අපේක්ෂකයාගේ අනන්‍යතාව: -

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණු ආවරණ කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

9. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි:-

9.1 තෝරා ගනු ලබන නිලධාරියකු, විදේශ රටවල පිහිටි දූත මණ්ඩල වෙත පත්කර හැරීමට පෙර, මූලිකව නිශ්චිත කාලසීමාවක් තුළ කොළඹ පිහිටි විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ සේවය කළ යුතුය. මෙම මූලික කාලසීමාවේදී විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ සේවය කරන ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම් අසතුටුදායක යැයි අංශ ප්‍රධානීන්ගේ එකඟතාව ඇතිව ස්වාධීන ආයතනයක් විසින් තක්සේරු කරනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කළ හැකිය. අමාත්‍යාංශයේ සේවය කරන කාලසීමාව අමාත්‍යාංශයේ අවශ්‍යතාව අනුව වෙනස් කළ හැකිය. තෝරා ගනු ලබන නිලධාරීන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට ස්ථාන මාරු කරනු ලැබේ. එම ස්ථාන මාරු කරනු ලබන දින සිට දින තිහක් (30) ඇතුළත, ඔහු/ඇය විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ රාජකාරි භාර නොගන්නේ නම්, එම ස්ථාන මාරුව අවලංගු වූවා සේ සලකනු ලබන අතර, අනුමත විශේෂ අවස්ථාවකදී හැර (උදා: ප්‍රසූත නිවාඩු) ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

9.2 අදාළ දූත මණ්ඩලවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා අවශ්‍යතාවට අනුකූලව හා නිලධාරියාගේ යෝග්‍යතාව හා දක්ෂතා (විදේශ භාෂා දැනුම ආදිය) පදනම් කර ගනිමින් සුදුසුකම් ලැබුවන් පත් කිරීම තීරණය කරනු ඇත. එවැනි පත්කිරීමක් තීරණය කිරීමේදී නිලධාරියාගේ පෞද්ගලික අවශ්‍යතා හා දුක්ගැනවිලි (දරුවන්ගේ අධ්‍යාපනය ආදී) පිළිබඳව සලකා බැලීමට අමාත්‍යාංශය කිසිදු ආකාරයකින් බැඳී නොමැත. තව ද, මෙම තෝරාගැනීමේ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු අනුපිළිවෙළට අනුව, එම පවතින පුරප්පාඩු පිරවීමට ද අමාත්‍යාංශය බැඳී නොමැත. යම් නිලධාරියකු ලබා දෙනු ලබන දූත මණ්ඩල පත්වීම භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත්, එම පත්වීම අවලංගු වූවා සේ ලෙස සලකනු ලබන අතර ඒ සම්බන්ධව ඉදිරිපත් කෙරෙන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. එවැනි නිලධාරියකු නව විභාගය සඳහා නැවත පෙනී සිටිය යුතු වන අතර, විභාගයේ වලංගුභාවය සහ සාධාරණ තේරීම් නිර්ණායකවල කොන්දේසි සහතික කිරීම සඳහා ඔහු/ඇය පෙර විභාගයේදී හා සම්මුඛ පරීක්ෂණයේදී අනුගමනය කළ ක්‍රියා පටිපාටියට මුහුණ දිය යුතු ය.

9.3 තෝරාගත් නිලධාරියකු විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කිරීමෙන් අනතුරුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරනු ලබන කොන්දේසි හා නියමවලට අනුකූලව සාමාන්‍යයෙන් වසර තුනක කාලසීමාවක් එම දූත මණ්ඩලයේ සේවය කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් ගිවිසුමකට ද එළඹිය යුතු වේ. සේවයේ අවශ්‍යතාව මත මෙම කාලය දීර්ඝ කිරීමට ද හැකියාව පවතී.

9.4 රාජ්‍ය සේවයේ (කළමනාකරණ සේවා නිලධාරි සේවයේ, පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ) නිලධාරීන් තෝරාගනු ලැබුවහොත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව වර්තමාන වැටුප් පරිමාණය මතම මින් ඉදිරියටත් වැටුප් ගෙවනු ලබන අතර, සෙසු නිලධාරීන්ට මසකට රු. 54,400/- ක ස්ථිර වැටුපක් ගෙවනු ලැබේ.

9.5 තෝරාගත් නිලධාරියකු විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කරනු ලැබූ විට, අදාළ රටට යාමට හා ඒමට ගුවන් ගමන් ගාස්තු, විදේශයේ ඔහු/ඇය සේවය කරන කාලය තුළදී පත්වීම ලබන රටේ නවාතැන් පහසුකම් සහ නිලධාරියා සහ රජය අතර අත්සන් තබන ලද ගිවිසුමේ සඳහන් කර ඇති අන්දමට වෙනත් දීමනා සඳහා පිරිවැය, නිලධාරියා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා සහ වයස අවුරුදු 21 ට අඩු අවිවාහක හා නිලධාරියාගෙන් යැපෙන යෝග්‍ය දරුවන් දෙදෙනකු සඳහා පමණක් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන පරිදි රජය විසින් දරනු ලැබේ. ඉහත සඳහන් කර ඇති ආකාරයට වඩා වෙනත් පවුලේ සාමාජිකයින් සමඟ පැමිණීම සඳහා කරනු ලබන ඉල්ලීමකට අමාත්‍යාංශය ඉඩ ලබා දෙනු නොලැබේ.

9.6 අපේක්ෂකයන් දැනටමත් EPF / ETF හෝ PPE ප්‍රතිලාභ සඳහා ලියාපදිංචි වී ඇත්නම් ඔවුන් PSPF වැනි සේවා අවසාන ප්‍රතිලාභ සඳහා හිමිකම නොලබයි.

9.7 රාජකාරී චාරිකාව සඳහා නියමිත කාල සීමාව අවසන් වූ පසුව, නිලධාරියා නැවත ශ්‍රී ලංකාවට පැමිණීම අනිවාර්ය වේ.

10. එමෙන්ම මෙම විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් අනුව, පවතින පුරප්පාඩු සියල්ලම සඳහා පත්කිරීම හෝ පුරප්පාඩුවලින් කොටසක් සඳහා පත්කිරීම හෝ පත්නොකිරීම පිළිබඳ අවසන් තීරණය විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම් සතු වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතීනම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

අරුණි රණරාජ,
ලේකම්,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ
සංචාරක අමාත්‍යාංශය.

2026 නොවැම්බර් මස 13 දින,
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ-1.

11 - 363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.